# පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 08 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 30 දිනද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී භාවිතා කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මෙහෙයුම් කටයුතු සහ ආදායම් ඉපයීම සඳහා භාවිතා කර තිබූ රු. 21,331,327 ක ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන්කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වියදම සභාවේ තත්‍ය වියදම නිරූපණය කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබී තිබුණු රු. 90,400 ක් වූ ස්ථාවර තැන්පතු පොළිය ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුලත් වත්කම් අයිතම 189 ක වටිනාකම තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා උසාවි දඩ ගාස්තු ලෙස රු. 141,582 ක් ලැබී තිබුණ ද, එය රු. 197,427 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු. 55,845 ක උසාවි දඩ ගාස්තු වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී ඇති හඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 37,275 ක් සහ හිඟ කඩ කාමර කුලී රු. 479,872 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.7,558,292 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 <u>නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්.</u>

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති , රෙගුලාසි සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1989 අප්‍රේල් 17 දිනැති අංක 554/ 5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි වගන්තිය | සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබීම. |

| | | |
|---|---|---|
| **(ආ)** | රාජ්‍ය පරිපාලන පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | සභාව සතු වාහන 08 ක් සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබීම. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.383,973 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.186,388 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

සමාලෝචිත වර්ෂයෙ තත්‍ය වියදම සහ අයවැයගත ප්‍රතිපාදන අතර සියයට 11 සිට සියයට 237 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය.

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, සත්‍ය ආදායම සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | **රු.000** | **රු.000** | **රු.000** |
| (I) | වරිපනම් හා බදු | 100 | 40 | 60 |
| (II) | බදු කුලී | 500 | 126 | 470 |
| (III) | බලපත්‍ර ගාස්තු | 285 | 220 | 101 |
| (IV) | වෙනත් ආදායම් | 60,363 | 13,673 | 46,944 |

### 2.3.2 උසාවි දඩ

නැගෙනහිර පලාත් සභාවෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් ලැබිය යුතුව තිබූ රු. 439,993 ක් ලබා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

### 2.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | - | 01 |
| ද්විතීක මට්ටම | 13 | 05 | 08 |
| තෘතීය මට්ටම | 23 | 11 | 12 |
| එකතුව | 37 | 16 | 21 |

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) විධායක හා ද්වීතීයික මට්ටම් තුළ විගණන දිනය වන විටද ආයර්වේද වෛද්‍ය තනතුර, කළමනාකරණ සහකාර තනතුරු 04 ක් , සංවර්ධන නිලධාරි තනතුරු 02 ක් සහ පුස්තකාලයාධිපති තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුණි.

(ඇ) තෘතියික මට්ටම තුළ විදුලි කාර්මික තනතුරක්, ආයුර්වේද සහකාර තනතුරක් , රියදුරු තනතුරක් සහ කම්කරු තනතුරු 09 ක් පුරප්පාඩුව පැවතුණි.

### 2.5 කොන්ත්‍රාත් පරිපාලනය

පදවි ශ්‍රී පුර මහජන වෙළඳපොල සංකීර්ණය ඉදිකිරීමේ කර්මාන්තයේ ප්‍රමාද දින 404 කට අදාලව කොන්ත්‍රාත්කරුවකුගෙන් අයකර ගත යුතු රු. 960,835 ක ප්‍රමාද ගාස්තු සමාලෝචිත වර්ෂය තුළ දී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 කළමනාකරණ අකාර්යක්ෂමතා

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය (JICA) මගින් නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතියෙන් සභාව වෙත 2012 සහ 2013 වර්ෂවලදී ලැබී තිබූ වටිනාකම රු. මිලියන 4ක් ඉක්මවන ජල නල උපාංග විධිමත්ව අසුරා නොතැබීමෙන් එම උපාංග විනාශවෙමින් පැවතින.

## 03. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය